(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1999 අංක 21 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 ජූලි මස 27 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ජූලි මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. **5.75** යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

**1999 අංක 21 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1999 ජුලි මස 27 වැනි දින.]

එල්. ඩී.–ඕ. 65/98.

## 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1**. මේ පනත 1999 අංක 21 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : - 1991 අංක 52 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සෑම කාර්තුවක් සඳහා" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ : -

> "සෑම කාර්තුවක් සඳහා හෝ එහි කොටසක් සඳහා, ඒ කාර්තුව හෝ ඒ කොටස සඳහා වූ ඒ තැනැත්තාගේ පිරිවැටුම හෝ එහි කොටසක් මත, මේ පනතේ උපලේඛනයෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ආගණනය කරනු ලබන (මෙහි මින් මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ආරක්ෂක බද්දක් අය කරනු ලැබිය යුතුය."

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) (උ) ඡේදයේ "ඒ භාණ්ඩයේ වටිනාකම ; සහ" යන වචන වෙනුවට "ඒ භාණ්ඩයේ වටිනාකම:" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ඌ) ඡේදයේ "ඒ අමතර කොටසේ වටිනාකම" යන වචන වෙනුවට "ඒ අමතර කොටසේ වටිනාකම; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තිය අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් : -

"(එ) එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ ඒ සංවිධානයේ යම් විශේෂිත නියෝජ්‍යායතනයකට හෝ යම් විදේශ ආණ්ඩුවක රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලයට හෝ ඒ දූත මණ්ඩලයේ රාජ්‍යතාන්ත්‍රික කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුට යම් භාණ්ඩයක් විකිණීමෙන් ලැබුණු මුදල් හෝ යම් සේවයක් සැළසීම වෙනුවෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් මුදලක්"

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (උ) ඡේදයේ "1997 ජනවාරි මස 1 වැනි දින හෝ එදිනට පසුව ආරම්භ වන සෑම වර්ෂකය ම, සෑම කාර්තුවක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1997 ජනවාරි මස 1 වැනි දින හෝ එදිනට පසුව එහෙත් 1998 ඔක්තෝබර් මස 01 වැනි දිනට පෙරාතුව ආරම්භ වන සෑම වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් : සහ

(2) (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්: -

"(ඌ) 1998 ඔක්තෝබර් මස 01 වැනි දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා –

(i) 1998 ඔක්තෝබර් මස 01 වැනි දිනයෙන් ආරම්භව 1998 නොවැම්බර් මස 05 වැනි දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා, 1998 නොවැම්බර් මස පහළොස් වැනි දින හෝ එදිනට පෙර –

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට : සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන වන මුදලක් ;

(ii) 1998 නොවැම්බර් මස 06 වැනි දිනයෙන් ආරම්භව 1998 නොවැම්බර් මස 30 වැනි දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා, 1998 දෙසැම්බර් මස පහළොස් වැනි දින හෝ එදිනට පෙර –

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට පහ හමාරකට ; සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන වන මුදලක් ;

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වැනි දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදලින් අඩු කරනු ලැබූ පසු ලැබෙන මුදල ; සහ

(ඊ) 1999 ජනවාරි මස 01 වැනි දින හෝ එදිනට පසු ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා –

(i) ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස් වැනි දින හෝ එදිනට පෙර. ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා–

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට පහ හමාරකට ; සහ

(ඇ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන වන මුදලක් ;

(ii) ඒ කාර්තුවේ තුන් වන මාසයේ පහළොස් වැනි දින හෝ එදිනට පෙර ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා –

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට පහ හමාරකට : සහ

(ඇ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන වන මුදලක් : සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වැනි දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදලින් අඩු කරනු ලැබූ විට ලැබෙන මුදල".

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඒ උපලේඛනයේ 7 වන අයිතමයේ "1997 ජනවාරි මස 01 වැනි දින හෝ එදිනට පසුව ආරම්භ වන සෑම වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා" යන වචන හා ඉලක්කම් වෙනුවට "1997 ජනවාරි මස 01 වැනි දින හෝ එදිනට පසුව, එහෙත් 1998 ඔක්තෝබර් මස 01 වැනි දිනට පෙරාතුව ආරම්භ වන සෑම වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනය අගට පහත දැක්වෙන අයිතමයන් එකතු කිරීමෙන්: -

"8. 1998 ඔක්තෝබර් මස 01 වැනි දින ආරම්භ වන කාර්තුව සඳහා -

(i) (ii) වන ඡේදයෙහි සඳහන් පිරිවැටුම නොවන–

(අ) 1998 ඔක්තෝබර් මස 01 වැනි දිනයෙන් ආරම්භව, 1998 නොවැම්බර් මස 05 වැනි දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා වූ පිරිවැටුම මත

සියයට 4 1/2

(ආ) 1998 නොවැම්බර් මස 06 වැනි දිනයෙන් ආරම්භව 1998 දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා වූ පිරිවැටුම මත

සියයට 5 1/2

(ii) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මොටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන පිරිවැටුම මත

සියයට 0.5

9. 1999 ජනවාරි මස 1 වැනි දින හෝ එදිනට පසුව ආරම්භ වන සෑම වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා –

(i) මේ අයිතමයේ (ii) වන ඡේදයේ සඳහන් පිරිවැටුම නොවන පිරිවැටුම මත

සියයට 5 1/2

(ii) (203 වන අධිකාරය වන) මොටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන පිරිවැටුම මත

සියයට 0.5

**5**. 1998 නොවැම්බර් මස 06 වැනි දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලය තුළ, පිරියත, යන්ත්‍ර හෝ උපකරණ නොවන යම් භාණ්ඩයක් වලංගු කිරීම.

ආනයනය කරන තැනැත්තකුගෙන් ඒ භාණ්ඩයේ වටිනාකමින් සියයට හතර හමාරක් ඉක්මවන මුදලක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කරනු ලබන අවස්ථාවක, ඒ එකතු කිරීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස කර ඇති බවට සහ වලංගු ලෙස කරනු ලැබූ බවට සළකනු ලැබිය යුතු අතර, ඒ එකතු කිරීම සම්බන්ධයෙන් ඒ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා, සිවිල් හෝ අපරාධ හෝ වූ සියලු නඩුවලට එරෙහිව මෙයින් හානිපූරණය කරනු ලැබේ.

අන්තර් කාලීන විධිවිධාන.

6. මේ පනත අදාළ වන තැනැත්තකු විසින් 1998 නොවැම්බර් මස 06 වැනි දින සිට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය තෙක් වූ කාලසීමාව සම්බන්ධයෙන් ඒ තැනැත්තාගේ ඒ කාලසීමාව සඳහා වූ පිරිවැටුමෙන් සියයට හතර හමාර ඉක්මවන මුදලක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීමට මේ පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මගින් ඒ තැනැත්තාට නියම කරනු ලැබ ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ කාලසීමාව සඳහා ගෙවීමට මේ පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙන් ඔහුට නියම කරන ලද මුදල සහ ඒ කාලසීමාව සඳහා ඔහු විසින් ගෙවන ලද මුදල අතර වෙනස, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දින සිට දින තිහක් ඇතුළත ඔහු විසින් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවනු ලැබුවහොත්, ඒ තැනැත්තා ඒ වගන්තියේ නියම අනුව ක්‍රියා කර ඇතැයි සියලු කාර්ය සඳහා සළකනු ලැබිය යුතු ය. ඒ වෙනස එසේ ගෙවා නොමැති අවස්ථාවක, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසු ඒ වෙනස ගෙවීම පැහැර හැර ඇති ලෙස සළකනු ලැබිය යුතු අතර, ප්‍රධාන ප්‍රඥප්තියේ අර්ථානුකූලව ඒ තැනැත්තා ඒ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සළකනු ලැබිය යුතු ය.

අතීතයට බලපෑම.

7. මේ පනතේ 2(2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට කරන ලද සංශෝධනය, 1999 අප්‍රේල් මස 01 වැනි දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සළකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.